3/7/16

" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
සාමාන්‍ය දුරකථන / பொதுவான இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 | SLAB ISO/IEC: 17021

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/PTR/2-4/FI/6(D)
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2021.09. 14

බස්නාහිර පළාත් අධ්‍යාපන,සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු සහ
16 SEP 2021
තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය

email

ලේකම්, පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය (බ.ප.)

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (බ.ප.)

බස්නාහිර පළාතේ සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

**<u>බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය යටතේ පවතින පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම.</u>**

බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය යටතේ පවතින පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා කලාප අධ්‍යාපන කාර්යාල වල ඉදිරියේ දී පුරප්පාඩු වීමට නියමිත පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | ආයතනය | අනුමත ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (බ.ප.) | I ශ්‍රේණිය |
| 02. | අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (බ.ප.) | I ශ්‍රේණිය |
| 03. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය (හෝමාගම) | I ශ්‍රේණිය |
| 04. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය (ගම්පහ) | I ශ්‍රේණිය |
| 05. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය (පිළියන්දල) | I ශ්‍රේණිය |
| 06. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය (කළුතර) | I ශ්‍රේණිය |

02. සුදුසුකම් -

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.
- අයදුම්කරු පසුගිය වසර 05 තුළ කිසිදු විනයානුකූල දඬුවමකට යටත් නොවූ අයකු විය යුතු අතර, එම වසර 05 තුළදී සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.
- සෑම අයදුම්කරුවෙකුම,තම තනතුරේ සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

03. **තෝරාගනු ලබන ක්‍රමවේදය -**

**02** ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්, බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පදනම්ව ලකුණු ලබා දෙන අතර එම ලකුණු මත පදනම්ව ඉහළම ලකුණු ලබා ගත් නිලධාරියා අදාළ තනතුරට තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

04. නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කල යුතු වේ. එසේම තනතුරු කිහිපයකට ඉල්ලුම් කරනු ලබන්නේ නම් නිලධාරීන් විසින් ඒ සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.

05. මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ/ කලාප අධ්‍යාපන කාර්යාලයේ හා ඒ යටතේ වන ආයතනයන්හි සේවය කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සුදුසුකම්ලත් නිලධාරීන් දැනුවත් කර, මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව, ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් **2021.09.27** දිනට හෝ ඊට පෙර **achiefsecretary@gmail.com** දරණ විද්‍යුත් තැපැල වෙත යොමු කර, එහි දෘඩ පිටපතක් **2021.09.30** දිනට හෝ ඊට පෙර " ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය (බස්නාහිර පළාත් සභාව), අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට කටයුතු කරන ලෙස ද දැනුවත් කරන්නේ නම් මැනවි.

06. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, පත්කිරීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් සතුවේ.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත

**<u>අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන) , අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන)</u>**

**<u>තනතුරු හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය</u>**

| | | | | |
|---|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨතාවය | **උපරිම ලකුණු 60** | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ මුල් සේවා කාලය අවම වසර 03 ක සේවා කාලයට අමතරව සම්පූර්ණ කර ඇති සක්‍රිය සේවා කාලයේ වසර 03 හෝ ඊට වැඩි අමතර සේවා කාලයක් සහිත නිලධාරීන්ට උපරිම ලකුණු ද,<br>සෙසු අයට පහත පරිදි අමතර සේවා කාලය සඳහා ලකුණු දෙනු ලැබේ.<br>එක් වසරකට ලකුණු 20<br>මාස 06 කට ලකුණු 10<br>මාස 03 කට ලකුණු 05 | ලකුණු 60 |
| 2. | කුසලතාවය | **උපරිම ලකුණු 40** | ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධි ල.12/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (අවු 01 හෝ ඊට වැඩි) ල.6 / ඩිප්ලෝමා (මාස 6 හෝ ඊට වැඩි) ල.3 | ලකුණු 12 |
| | | | ක්ෂේත්‍රයට අදාළ පාඨමාලා, කළමනාකරණ පාඨමාලා, පුහුණු පාඨමාලා (මාස 3 ට වැඩි) එක් පාඨමාලාවකට ලකුණු 1 ½ බැගින් | ලකුණු 03 |
| | | | තොරතුරු තාක්ෂණ පුහුණුව (මාස 1 සිට 3 දක්වා - ල.02, මාස 3ට වැඩි - ල.03) | ලකුණු 03 |
| | | | පර්යේෂණ, නිබන්ධන, ග්‍රන්ථ, විෂය ක්ෂේත්‍රයට අදාළ පුවත් පත් ලිපි<br>(පශ්චාත් උපාධිය හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඔබ විසින් ඉදිරිපත් කරන ලද ඉහත ලේඛන වලට අමතරව ලේඛන ඉදිරිපත් කල යුතුය) | ලකුණු 03 |
| | | | සේවා ඇගයීම | ලකුණු 03 |
| | | | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය/ පෞරුෂත්වය / සන්නිවේදනය | ලකුණු 03 |
| | | | වෙනත් විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව ලබා ඇති ප්‍රවීණතාවයන් හා ලබා ඇති වෙනත් සුදුසුකම් | ලකුණු 03 |
| | | | කාර්ය සාධනය, විශිෂ්ඨ මට්ටම (ල.2)/ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ (ල.1.5) / සතුටුදායක මට්ටම (ල.1) | ලකුණු 10 |

(කාර්යාල ප්‍රයෝජනය සඳහා)

**<u>ආදර්ශ අයදුම් පත්‍රය</u>**

**<u>.................................................................................................................... තනතුර අයදුම් කිරීම</u>**

01. මුලකුරු සමග නම -

02. සම්පූර්ණ නම -

03. උපන්දිනය -

04. පෞද්ගලික ලිපිනය -

05. හැඳුනුම්පත් අංකය -

06. දුරකථන අංකය -

07. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත්වූ දිනය -

08. ශ්‍රී ලං.අ.පරි.සේ.II ශ්‍රේණියට උසස් වූ දිනය -

09. ශ්‍රී ලං.අ.පරි.සේ.I ශ්‍රේණියට උසස් වූ දිනය -

10. පූර්වාසන්න වසර 05 තුල කාර්යසාධනය -

| වසර | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| | | | | |

11. (i) වර්තමාන සේවා ස්ථානය-

(ii) දරන තනතුර -

(iii) එම තනතුරට පත්වූ දිනය-

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

.................................................

දිනය - අයදුම්කරුගේ අත්සන

**<u>ආයතන ප්‍රධානියා සහ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය -</u>**

................................................................................ මහතා / මහත්මිය / මෙනවිය සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පැවැත්වෙන බව / නොපැවැත්වෙන බව දන්වන අතර, ඔහු / ඇය විසින් සඳහන් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. මෙම නිලධාරියා ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුව හොත් දැනට සිටින සේවා ස්ථානයෙන් අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව මුදාහැරීමට එකඟ වෙමි / නොවෙමි.

දිනය - .................................................

අත්සන හා නිල මුද්‍රාව

**<u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>**

ආයතන ප්‍රධානියාගේ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයට එකඟ වෙමි / එකඟ නොවෙමි

දිනය - .................................................

අත්සන හා නිල මුද්‍රාව